සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

33 S I

පෙරහුරු පරීක්ෂණය- 13 ශ්‍රේණිය- 2021
**Model Paper – Grade 13- 2021**

විභාග අංකය .............................

ගිණුම්කරණය I

කාලය පැය දෙකයි

| උපදෙස් |
|---|
| ♦ අංක 01 සිට 30 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න. |
| ♦ අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉරි මත ලියන්න. |
| ♦ සෑම ප්‍රශ්නයකටම ලකුණු දෙක බැගින් හිමි වේ. |
| ♦ විභාග අංකය ඉහළින් ඇති කොටුවේ පැහැදිලි ව සටහන් කරන්න. |

| ප්‍රශ්න අංක | ලකුණු |
|---|---|
| 01 - 30 | |
| 31 - 50 | |
| එකතුව | |

1) පහත දැක්වෙන කුමන ප්‍රකාශනය විශේෂිත පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් නිවැරදි වේද?
   1. ව්‍යාපාරයක දැනට සිටින සහ අපේක්ෂිත ආයෝජකයන්ට ,ණය සපයන්නන්ට සහ අනෙකුත් ණය හිමියන්ට ව්‍යාපාරයට සම්පත් සැපයීම පිළිබඳව තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු සපයයි.
   2. ආයතනයක තොරතුරු භාවිතා කරන්නන්ට අතීත තොරතුරු සපයයි.
   3. ආයතනයක කළමණාකරුවන්ට තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු සපයයි.
   4. ගිණුම්කරණ ප්‍රමිති හා සංකල්ප යොදා ගනිමින් කළමණාකරුවන්ට තොරතුරු සැපයීම.
   5. ආයතනයක වාර්ෂික විගණනයට අවශ්‍ය තොරතුරු සැපයීම.

2) ව්‍යාපාරයක අයිතිකරුවන්ගේ පෞද්ගලික වියදම් ව්‍යාපාරයේ වියදම් ලෙස නොසැලකීමට පදනම්වන ගිණුම්කරණ සංකල්පය කුමක්ද?
   1. උපචිත සංකල්පය
   2. ව්‍යාපාර ඒකක සංකල්පය
   3. උපලබ්ධි සංකල්පය
   4. රක්ෂණ සංකල්පය
   5. මූල්‍ය මිනුම් සංකල්පය

3) භාණ්ඩ ගනුදෙනුකරුවන්ට බෙදාහරින අවස්ථාවේදී විකුණුම් අයභාරය  ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු  ලබන්නේ කුමන ගිණුම්කරණ සංකල්පයට අනුවද?
   1. උපලබ්ධි
   2. උපචිත
   3. ගැලපුම්
   4. ආරක්ෂණ
   5. කාලච්ඡේද

4) මූල්‍ය වාර්ථාකරණයේ ආකෘතිමය රාමුවට අනුව මූල්‍ය ප්‍රකාශන තොරතුරුවල ගුණාත්මක ගතිලක්ෂණ ප්‍රධාන වර්ග දෙක වන්නේ.
   1. මූලික ගුණාත්මක ගතිලක්ෂණ, සංසන්ධනාත්මක බව.
   2. උසස්කරලීමේ ගුණාත්මක ගතිලක්ෂණ, විශ්වසනීය නියෝජනය.
   3. අදාළ බව, විශ්වසනීය නියෝජනය.
   4. සංසන්ධනාත්මක බව, තේරුම්ගතහැකි බව.
   5. මූලික ගුණාත්මක ගතිලක්ෂණ, උසස්කරලීමේ ගුණාත්මක ගතිලක්ෂණ.



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources
iexamhub

5) 15% VAT සඳහා ලියාපදිංචි සමාගමක් පිරිවැය රු 200,000 තොගයක් 25% ලාභාන්තිකයක් සහිතව ණයට විකිණීම නිවැරදි ගිණුම්කරණ සමීකරණයට ආදේශ කල පිළිතුර වන්නේ,

| | වත්කම් | | හිමිකම් | වගකීම් |
|---|---|---|---|---|
| 1. | +87 500 | = | +50 000 | +37 500 |
| 2. | +50 000 | = | +50 000 | |
| 3. | +250 000 | = | +50 000 | +20 000 |
| 4. | -200 000 | = | | -200 000 |
| 5. | +87 500 | = | +87 500 | |

6) ලී බඩු අලෙවිකරණ ව්‍යාපාරයක පහත ගනුදෙනු සටහන් කිරීමට භාවිතා කරන උපයෝගී පොත නිවැරදිව පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,

A. අයිතිකරු විසින් ප්‍රාග්ධනය ලෙස රු 100 000 යෙදීම.
B. සුළු මුදල් අග්‍රිමය රු 5000 ගෙවීම.
C. ලී බඩු තොගයක් පෙරේරා සමාගමෙන් ණයට ගැනීම.
D. ණයගැතියන්ගෙන් රු 10 000 බොල්ණය ලෙස කපාහැරීම.

1. පොදු ජ'නලය, සුළු මුදල් ගෙවීම් ජ'නලය, ගැනුම් ජ'නලය, පොදු ජ'නලය.
2. මුදල් ගෙවීම් ජ'නලය, සුළු මුදල් ගෙවීම් ජ'නලය, පොදු ජ'නලය, ණයගැති උපලෙජරය.
3. පොදු ජ'නලය, මුදල් ගෙවීම් ජ'නලය, පොදු ජ'නලය, මුදල් ගෙවීම් ජ'නලය.
4. මුදල් ලැබීම් ජ'නලය, මුදල් ගෙවීම් ජ'නලය, ගැණුම් ජ'නලය, මුදල් ගෙවීම් ජ'නලය,
5. පොදු ජ'නලය, සුළු මුදල් ගෙවීම් ජ'නලය, පොදු ජ'නලය, මුදල් ගෙවීම් ජ'නලය.

7) ලැබූ කුලී වෙනුවෙන් ලද රු 150 000 වෙක්පත අහරුවීම් ගිණුම්ගත කිරිම සඳහා තැබිය යුතු ද්විත්ව සටහන වන්නේ,

1. ලැබූ කුලී හර
   මුදල් බැර

2. ලැබිය යුතු කුලී හර
   ණයහිමි පාලන බැර

3. ලැබිය යුතු කුලී හර
   මුදල් බැර

4. අහරු වෙක්පත හර
   මුදල් බැර

5. අහරු වෙක්පත හර
   ණයහිමි පාලන බැර

8) 11% VAT ලියාපදිංචි සමාගමක් රු 666 000 (VAT සහිත මිල) ණයට විකුණුම් වලට අදාළ VAT සටහන් කිරීමේ නිවැරදි ද්විත්ව සටහන වන්නේ,

1. ණයගැති පාලන හර 72 600
   VAT බැර 72 600

2. ණයගැති පාලන හර 660 000
   VAT බැර 660 000

3. මුදල් හර 73 260
   VAT බැර 73 260



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

4. ණයගැති පාලන හර 73 260
VAT බැර 73 260

5. ණයගැති පාලන හර 66 000
VAT බැර 66 000

9) උපචිත පදනම මත පිළියෙල කරනු ලබන මූල්‍ය ප්‍රකාශන වන්නේ,
1. ලාභාලාභ හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය.
2. හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය.
3. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය.
4. හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා ලැබීම් හා ගෙවීම් ගිණුම.
5. මුදල් ගිණුම හා වෙළඳ හා ලාභාලාභ ගිණුම.

10) ව්‍යාපාරයක පහත තොරතුරු දැකිය හැකි විය.
2020.03.31 දිනට - ඉදිරිපත් නොවූ චෙක්පත් රු. 20 000
උපලබ්ධි නොවූ චෙක්පත් රු. 40 000
2020. අප්‍රේල් මාසයේ - මුදල් ලැබීම් ජ'නලයේ මුළු එකතුව 80 000
මුදල් ගෙවීම් ජ'නලයේ මුළු එකතුව 120 000
2020.04.30 දිනට බැංකු ප්‍රකාශයට අනුව,
- ගෙවූ චෙක්පත් රු. 110 000
- උපලබ්ධි වූ චෙක්පත් රු. 100 000
-04/30 දිනට ශේෂය රු. 60 000
2020. 04. 30 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්විය යුතු මුදල් ශේෂය වන්නේ,
1. රු. 30 000කි.
2. රු. 40 000කි.
3. රු. 50 000කි.
4. රු. 60 000කි.
5. රු. 70 000කි.

11) සි/ස රත්න සමාගමේ 2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු ලබා දී ඇත,

| | | |
|---|---|---|
| දුන් වට්ටම් | | රු.15 000 |
| කපාහල බොල්ණය නැවත ලැබීම් | | රු. 8000 |
| බොල්ණය කපාහැරීම් | | රු.10 000 |
| අඩමාණ ණය වෙන්කිරීම් | 2019.04.01 දිනට | රු. 4500 |
| | 2020.03.31 දිනට | රු. 6000 |

2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ණයගැතියන් සම්බන්ධව වියදම වන්නේ,
1.රු. 8 000කි.
2.රු. 15 000කි.
3.රු. 16 500කි.
4.රු. 18 500කි.
5.රු. 26 500කි.

12) 2020.03.31 දිනට ණයගැති පාලන ගිණුමේ ශේෂය 86 000 වූ අතර එදිනට ණයගැති ශේෂ ලැයිස්තුවේ එකතුව මීට වෙනස් විය.පසුව විමර්ශනයේදි පහත වැරදි අනාවරණය විය.
1. දුන් වට්ටම් රු. 9 000 පොදු ලෙජරයේ සටහන් වී නැත.
2. ආපසු එවුම් ජනලයේ එකතුව රු. 3 000 අඩු වී ඇත.
3. ණයගැතියෙකුගෙන් ලද රු. 12 000 ඔහුගේ ගිණුමේ ණයට විකුණුම් ලෙස සටහන් වි ඇත.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

2020.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්විය යුතු ණයගැති ශේෂය හා ණයගැති ශේෂ ලැයිස්තුවේ එකතුව වන්නේ,

| 2020.03.31 දිනට **වෙළඳ ලැබිය යුතු දෑ (රු)** | 2020.03.31දිනට **ණයගැතිශේෂ ලැයිස්තුවේ එකතුව(රු)** |
|---|---|
| 1. 74 000 | 86 000 |
| 2. 74 000 | 98 000 |
| 3. 86 000 | 98 000 |
| 4. 86 000 | 100 000 |
| 5. 100 000 | 100 000 |

13) 2020.03.31 දිනට සීමිත රංගන සමාගමේ ශේෂ පිරික්සුම තුලනය නොවූ අතර එම වෙනස අවිනිශ්චිත ගිණුමකට මාරු කරන ලදී. පසුව කරන ලද විමර්ශනයේදී පහත වැරදි හෙළිදරව් විය.

A. ප්‍රවාහන වියදම් සඳහා ගෙවූ රු. 50 000 ප්‍රවාහන වියදම් ගිණුමේ සටහන් වී නැත.
B. රු. 15 000 විකුණුම් ඉන්වොයිසියක් විකුණුම් ජනලයේ රු. 150 000 ලෙස සටහන් වී තිබීම.
C. ලැබූ කුලී ගිණුමේ ශේෂයරු. 10 000 ශේෂ පිරික්සුමට ගෙන නැත.
D. රු. 12 000 ආපසු එවුම් විකුණුම් ගිණුමට හර කර ඇත.

ඉහත කුමන වැරදි අවිනිශ්චිත ගිණුමේ ශේෂයක් ඇතිවීමට බලපායිද?

1. A පමණී.
2. B පමණී.
3. A හා B පමණී.
4. D පමණී.
5. A හා C පමණී.

14) පහත තොරතුරු වෙළෙඳ ව්‍යාපාරයකට අදාළ වේ.

| | |
|---|---|
| 2019.04.01 දිනට තොගය | රු. 120 000 |
| වර්ෂයේ ගැනුම් | රු. 780 000 |
| වර්ෂයේ විකුණුම් | රු. 900 000 |

2020.03.31 දින ඇති වූ ගින්නකින් එදිනට පැවති මුළු තොගයම ගිනි ගෙන විනාශ වී ඇති අතර ඒ සඳහා 75% ක් රක්ෂණ වන්දියක් ලැබීමට නියමිතය. ව්‍යාපාරය භාණ්ඩ වල මිල ලකුණු කරනුයේ පිරිවැයෙන් 25% ක ලාභයක් තබා ගෙනය. හානි වූ තොගයේ පිරිවැය හා එම නිසා ලාභයට වන ශුද්ධ බලපෑම වන්නේ,

| හානි වූ තොගයේ පිරිවැය | ලාභයට කරන ශුද්ධ බලපෑම |
|---|---|
| 1. 60 000 | 45 000 න් වැඩි වේ. |
| 2. 160 000 | 35 000 න් අඩු වේ. |
| 3. 180 000 | 45 000 න් අඩු වේ. |
| 4. 240 000 | 180 000 න් අඩු වේ. |
| 5. 300 000 | 180 000 න් වැඩි වේ. |

15) 2017.04.01 දින සාමාජිකයින් 36 දෙනෙකුගෙන් ආරම්භකල යෞවන සමාජයක යාවජීව සාමාජිකයින් 6 දෙනෙකුද සිටියහ. වාර්ෂික සාමාජික මුදල රු. 2000 වන අතර **යාවජීව සාමාජික මුදල එමෙන් දස ගුණයකි** . යාවජීව සාමාජික මුදල වසර 5ක් තුල ආදායම තුල හඳුනාගනී.

2019.03.31 දිනට පහත තොරතුරු දැකිය හැකි විය.

- ලැබිය යුතු සාමාජික මුදල් රු. 6000
- යාවජීව සාමාජික මුදල රු. 72000



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

2020.03.31 දිනට සාමාජිකයින් 4 දෙනෙකු සාමාජික මුදල් ගෙවා නොතිබුන අතර ඉන් 3 දෙනෙකු 2018/2019 වර්ෂය සඳහා සාමාජික මුදල් නොගෙවා ඇති බැවින් ඔවුන්ගේ සාමාජිකත්වය අහෝසි කරන ලදී. සාමාජිකයින් දෙනෙකු ඉදිරි වාර්ෂය සඳහාද සාමාජික මුදල් ගෙවා තිබුණි.

2020.03.31 දිනෙන් අවසන් වර්ෂයේ සාමාජික මුදල් ආදායම හා මුදලින් ලද සාමාජික මුදල වන්නේ,

| | සාමාජික මුදල් ආදායම | මුදලින් ලද සාමාජික මුදල |
|---|---|---|
| 1. | 24 000 | 54 000 |
| 2. | 54 000 | 54 000 |
| 3. | 54 000 | 56 000 |
| 4. | 78 000 | 56 000 |
| 5. | 78 000 | 62 000 |

16) අමල් කමල් 2:1 අනුපාතයට ලාභාලාභ බෙදා ගනිමින් පවත්වාගෙන ගිය හවුල් ව්‍යාපාරයට 2020.04.01 දින නිමල් බඳවාගත් අතර ඔහු ප්‍රාග්ධනය ලෙස රු. 400 000 ගෙන එන ලදී. නව හවුල් ව්‍යාපාරයේ ලාභාලාභ අනුපාතය 3:2:1 වේ.කීර්තිනාමය ප්‍රාග්ධන ගිණුම තුළින් ගලපනු ලැබේ.
2021.03.31 දිනට ප්‍රාග්ධන ගිණුම් ශේෂ,
අමල් - රු. 640 000
කමල් - රු. 500 000
නිමල් - රු. 360 000
නිමල් බඳවාගත් දිනට කීර්තිනාමය සහ අමල්ගේ 2020.04.01 දිනට ප්‍රාග්ධන ගිණුම් ශේෂය වන්නේ,

| | කීර්තිනාමය (රු) | ප්‍රාග්ධන ගිණුම් ශේෂය (රු) |
|---|---|---|
| 1. | 120 000 | 160 000 |
| 2. | 120 000 | 240 000 |
| 3. | 240 000 | 360 000 |
| 4. | 240 000 | 600 000 |
| 5. | 260 000 | 640 000 |

- 17, 18 හා 19 ප්‍රශ්න වලට පහත තොරතුරු භාවිතාකර පිළිතුරු සපයන්න.
පහත තොරතුරු 2021 ජනවාරි මාසයට අදාල වේ.
01/01 එකක් රු. 300 බැගින් ඒකක 100 මිලට ගත්තා.
01/08 එකක් රු. 350 බැගින් ඒකක 80 වික්කා.
01/20 එකක් රු. 420 බැගින් ඒකක 100 මිලට ගත්තා.
01/26 එකක් රු. 500 බැගින් ඒකක 70 වික්කා.

17) 2020.01.31 දිනට FIFO ක්‍රමයට හා WAC ක්‍රමයට තොගයේ පිරිවැය වන්නේ,

| | **FIFO ක්‍රමයට තොගයේ පිරිවැය** | **WAC ක්‍රමයට තොගයේ පිරිවැය** |
|---|---|---|
| 1. | 16 000 | 20 000 |
| 2. | 21 000 | 20 000 |
| 3. | 21 000 | 24 000 |
| 4. | 26 000 | 32 000 |
| 5. | 26 000 | 20 000 |



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

18) 2021.01.31 දිනෙන් අවසන් මාසයේ FIFO ක්‍රමයට විකුණුම් පිරිවැය හා දළ ලාභය වන්නේ,

| විකුණුම් පිරිවැය | දළ ලාභය |
|---|---|
| 1. 50 000 | 8 000 |
| 2. 50 000 | 12 000 |
| 3. 51 000 | 6 000 |
| 4. 51 000 | 8 000 |
| 5. 51 000 | 12 000 |

19) 2021.01.31 දිනෙන් අවසන් මාසයේ WAC ක්‍රමයට විකුණුම් පිරිවැය හා දළ ලාභය වන්නේ,

| විකුණුම් පිරිවැය | දළ ලාභය |
|---|---|
| 1. 52 000 | 11 000 |
| 2. 52 000 | 12 000 |
| 3. 56 000 | 14 000 |
| 4. 56 000 | 11 000 |
| 5. 58 000 | 12 000 |

20) සමාගමක් 2019.04.01 දින නව යන්ත්‍රයක් විදේශ රටකින් මිලට ගත් අතර ඊට අදාලව පහත වියදම් දරා ඇත. සමාගම 15% VAT ලියාපදිංචි සමාගමකි.

| වියදම් විස්තරය | (රු.000) |
|---|---|
| ගැනුම් මිල (VAT සහිත) | 2300 |
| නැව් ගාස්තු | 200 |
| තීරු බදු | 500 |
| සමාගම තෙක් ප්‍රවාහන වියදම් | 100 |
| සවිකිරීම් පිරිවැය | 150 |
| විවෘත කිරීමේ උත්සව වියදම් | 250 |
| නඩත්තු පිරිවැය (වාර්ෂික) | 200 |
| භාවිතයට පෙර අත්හදාබැලීම් පිරිවැය | 75 |

භාවිතයට පෙර කරනු ලබන අත්හදාබැලීමේ දී ඇති වූ නිමැවුම රු. 25 000 ට අලෙවිකරනු ලැබිය. සමාගම දේපළ පිරියත උපකරණ වාර්ෂිකව 10% බැගින් ක්ෂය කරනු ලබන්නේනම් යන්ත්‍රයේ මූලික පිරිවැය හා වාර්ෂික ක්ෂය ප්‍රමාණය වන්නේ,

| මූලික පිරිවැය (රු.) | වාර්ෂික ක්ෂය ප්‍රමාණය (රු.) |
|---|---|
| 1. 2000 000 | 200 000 |
| 2. 2750 000 | 275 000 |
| 3. 3000 000 | 300 000 |
| 4. 3250 000 | 325 000 |
| 5. 3500 000 | 350 000 |

21) සමාගමක් 2020.04.01 දින කල්බදු පදනමට මෝටර් රථයක් මිලට ගත් අතර එදිනට රු. 500 000 ගෙවු අතර එදිනට කල්බදු ගෙවීම් වල වර්තමාන අගය රු. 1200 000 විය. 2020.04.01 දිනට භාවිත අයිතිය සහිත වත්කම් වල පිරිවැය වන්නේ,

1. රු. 700 000
2. රු. 1200 000
3. රු. 1700 000
4. රු. 2000 000
5. රු. 2500 000



iexamhub www.iexamhub.com Your Trusted Partner for Exam Success Past Papers - Model Answers - Study Resources

- පහත තොරතුරු ඇසුරින් 22 සහ 23 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

සී/ස ප්‍රසාද් සමාගම 2019.04.01 දින මෙහෙයුම් කටයුතු ආරම්භ කල අතර 2020.03.31 දිනට පහත ශේෂයන් දැකිය හැකි විය.

| | |
|---|---|
| රඳවාගත් ඉපැයුම් | 860 000 |
| අතුරු ලාභාංශ | 50 000 |
| ක්ෂය | 80 000 |
| වත්කම් විකුණුම් ලාභ | 10 000 |
| තොග වැඩිවීම | 20 000 |
| ණයහිමි අඩුවීම | 15 000 |
| ආදායම් බදු | 150 000 |

- ආදායම් බදු මුදලින් ගෙවා ඇත.

22) 2020.03.31 දිනෙන් අවසන් වර්ෂයේ සී/ස ප්‍රසාද් සමාගමේ වර්ෂයේ ලාභය වන්නේ,
1. රු. 860 000
2. රු. 910 000
3. රු.950 000
4. රු.1 060 000
5. රු.120 000

23) 2020.03.31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය,
1. රු. 860 000
2. රු. 895 000
3. රු. 945 000
4. රු. 1 095 000
5. රු. 1 100 000

24) සී/ස සමාගම හිමිකම වෙනස් වීමට පහත කුමන ගනුදෙනු බලපායිද?
- A. ඉඩම් ප්‍රත්‍යාගණනයෙන් රු. 50 000 ලාභයක් ලැබීම.
- B. රු. 10 000 පොදු සංචිතයකට මාරු කිරීම.
- C. රු. 50 බැගින් වූ කොටස් 1000ක් හිමිකම් නිකුතුවක් කිරීම.
- D. රු. 20 බැගින් වූ කොටස් 2000ක් සංචිත ප්‍රාග්ධනිත කිරීම.
  1. A පමණි.
  2. B පමණි.
  3. A හා B පමණි.
  4. A හා C පමණි.
  5. A, B, C, හා D යන සියල්ලම.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

25) සී/ස සමාගමක ලාභාලාභ හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ 2020.03.31 දිනෙන් අවසන් වර්ෂයේ ඉපයූ වර්ෂයේ ලාභය හා මුළු විස්තීර්ණ ආදායම පිළිවෙලින් රු. 600 000 හා රු. 800 000කි.

වර්ෂය තුළ සිදුකල ඉඩම් ප්‍රත්‍යාගණනයෙන් රු. 350 000 අලාභයක් ලැබූ අතර මේ පිළිබඳව කිසිදු සටහනක් තබා නැත. මෙම ඉඩම මීට පෙර ප්‍රත්‍යාගණනයෙන් රු. 250 000 ක ලාභයක් ලබා ඇත.
මෙම නිසා සමාගමේ ලාභයේ හා මුළු විස්තීර්ණ ආදායමේ ශුද්ධ අඩු වීම වන්නේ,

| | වර්ෂයේ ලාභයේ අඩු වීම | මුළු විස්තීර්ණ ආදායමේ අඩු වීම |
|---|---|---|
| 1. | 100 000 | 100 000 |
| 2. | 100 000 | 250 000 |
| 3. | 100 000 | 350 000 |
| 4. | 250 000 | 350 000 |
| 5. | 350 000 | 350 000 |

26) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 10 (LKAS 10) අනුව පහත කුමන සිදුවීම් මූල්‍ය ප්‍රකාශන වල ගලපනු ලබයිද?
   A. වාර්තාකරණ දිනට අඩමාණ ණය වෙන්කල ණයගැතියෙකු ඉන්පසුව බුන්වත් වීම.
   B. සමාගම තම කොටස් හිමියන්ට අවසාන ලාභාංශයක් යෝජනා කිරීම.
   C. වාර්තාකරණ දිනට පැවති තොගය පිරිවැයට වඩා අඩු අගයකට විකිණීමට සිදු වීම.

   1. A පමණි.
   2. B පමණි.
   3. C පමණි.
   4. A B පමණි.
   5. A C පමණි.

- සී/ස ජයලංකා පොදු සමාගමේ 2020.03.31 දිනට ශේෂ පිරික්සුමේ දැක්වෙන පහත තොරතුරු ඇසුරින් 27 හා 28 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| | (රු.000) |
|---|---|
| විකුණුම් | 6500 |
| 2019.04.01 දිනට බදු වෙන්කිරිම | 300 |
| බදු පෙර ලාභය | 1200 |
| සාමාන්‍ය කොටස් ප්‍රාග්ධය | 7000 |
| රඳවාගත් ඉපැයුම් | 6000 |

2019/20 වර්ෂයේ ඇස්තමේන්තුගත බද්ද බදු පෙර ලාභයෙන් 1/3 ලෙස ගැලපිය යුතු අතර 2018/19 වර්ෂයේ සත්‍ය බදු වගකීම රු.450 000කි.

27) සමාගමේ ලාභාලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ දැක්වෙන ආදායම් බදු වටිනාකම වන්නේ,
   1. රු.300 000
   2. රු. 400 000
   3. රු.550 000
   4. රු.750 000
   5. රු.800 000



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

28) සමාගමේ ශුද්ධ ලාභ අනුපාතය වන්නේ,
1. 8%
2. 10%
3. 12%
4. 15%
5. 20%

29) පහත තොරතුරු සමාගමක් නිෂ්පාදනය කරන භාණ්ඩයකට අදාල වේ.

| | (රු.000) |
|---|---|
| විකුණුම් | 1600 |
| විචල්‍ය පිරිවැය | (1200) |
| දායකය | 400 |
| ස්ථාවර පිරිවැය | (240) |
| ලාභය | 160 |

වර්ථමාන ක්‍රියාකාරී මට්ටමේදී සමච්ඡේදන ලක්ෂය හා ආරක්ෂිත ආන්තිකය රුපියල් වලින්,

| | **සමච්ඡේදන ලක්ෂය (රු.000)** | **ආරක්ෂිත ආන්තිකය (රු.000)** |
|---|---|---|
| 1. | 120 | 480 |
| 2. | 480 | 480 |
| 3. | 800 | 640 |
| 4. | 960 | 640 |
| 5. | 1000 | 800 |

30) සමාගමක් විසින් නිෂ්පාදන තාක්ෂණය වැඩි දියුණු කිරීමේ අරමුණින් නව යන්ත්‍රයක් මිලට ගැනීමට බලාපොරොත්තු වන අතර ඒ පිළිබඳ පහත තොරතුරු දැකිය හැකිය.
-යන්ත්‍රයේ පිරිවැය රු. 1800 000
-වාර්ෂික ආදායම රු. 800 000
-යන්ත්‍රයේ වාර්ෂික නඩත්තු වියදම රු. 240 000
-සමාගම සිය දේපලපිරියත උපකරණ 10% බැගින් වාර්ෂික ක්ෂය කරනු ලැබීය.
මෙම ව්‍යාපෘතියට අදාලව පළමු වර්ෂයේ ඇස්තමේන්තුගත ශුද්ධ මුදල් ප්‍රවාහය හා අපේක්ෂිත වාර්ෂික ශුද්ධ ලාභය වන්නේ,

| | **ශුද්ධ මුදල් ප්‍රවාහය(රු.000)** | **වාර්ෂික ශුද්ධ ලාභය(රු.000)** |
|---|---|---|
| 1. | 240 | 120 |
| 2. | 240 | 240 |
| 3. | 560 | 300 |
| 4. | 560 | 380 |
| 5. | 800 | 380 |

- ප්‍රශ්න අංක 31 සිට 50 තෙක් ප්‍රශ්න වලට නිශ්චිත පිළිතුරු තිත් ඉර මත ලියන්න.

31) ..................................ක ප්‍රතිඵලයක් ලෙස බිහිවී ඇති ව්‍යාපාර විසින් පාලනය කල හැකි ............................... වත්කමක් ලෙස හඳුන්වනු ලබයි.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

32) පහත අංශයන්ට අදාලව මූල්‍ය ගිණුම්කරණය හා කළමණාකරණ ගිණුම්කරණය අතර ඇති වෙනස්කම් දක්වන්න.

| අංශය | මූල්‍ය ගිණුම්කරණය | කළමණාකරණ ගිණුම්කරණය |
|---|---|---|
| i. නීතිමය අවශ්‍යතාවය | ඇත | .............................. |
| ii. තොරතුරු භාවිතා කරන පාර්ශවය | ............................ | අභ්‍යන්තර |
| iii. සලකාබලන කාලසීමාව | අතීත | ............................... |
| iv. වාර්ථාකිරීමේ වාර ගණන | ............................ | නිශ්චිත නැත |

33) පහත ලෙජර් ගිණුම් අයත්වන මූල්‍ය ප්‍රකාශන මූලිකාංගය ලියන්න.

| ගිණුම | මූල්‍ය ප්‍රකාශන මූලිකාංගය |
|---|---|
| i. සමුච්චිත ක්ෂය ගිණුම | ...................................... |
| ii. ගැනිලි ගිණුම | ...................................... |
| iii. හානිකරණ අලාභ සඳහා ඉඩහැරීම | ...................................... |
| iv. ආපසු එවුම් | ...................................... |

34) 15% VAT සඳහා ලියාපදිංචි මාලිකා සමාගම රු.690 000(VAT සහිත මිල)ක වෙළඳ භාණ්ඩ ණයට ගත් අතර ඒවා 20% ලාභාන්තිකයක් සහිතව ණයට විකුණන ලදී.

(අ) මෙම ගනුදෙනුවෙන් සමාගම ලැබූ ලාභය කොපමණද? .................................................

(ආ) මෙම ගනුදෙනුව තුළින් ඇතිවන VAT වගකීම කොපමණද? .................................................

35) සී/ස සමාගම වෙළඳ ලැබිය යුතු දෑ පිළිබඳ පහත තොරතුරු දැකිය හැකි විය.

| | |
|---|---|
| 2019.04.01 දිනට ශේෂය | 120 000 |
| මුළු ණයට විකුණුම් | 500 000 |
| ආපසු එවුම් | 50 000 |
| දුන් වට්ටම් | 10 000 |
| මුදල් ලැබීම් | 320 000 |
| අඩමාණ ණය වෙන්කිරීම් | 60 000 |
| බොල්ණය කපාහැරීම් | 20 000 |

2020.03.31 දිනට වෙළඳ ලැබිය යුතු දෑ පාලන ගිණුමේ නිවැරදි ශේෂය කොපමණද?....................................

36) සී/ස ප්‍රින්ස් සමාගමේ 2020.03.31 දිනෙන් අවසන් වර්ෂයේ කෙටුම්පත් ශුද්ධ ලාභය රු. 620 000වූ අතර පසුව කරන ලද විමර්ෂණයේදී පහත වැරදි අනාවරණය වී ඇත.

A. ආපසු යැවුම් රු.120 000 ගැනුම් ගිණුමට බැර කර ඇත.
B. රු.15 000 දුන් වට්ටම් ලද වට්ටම් ගිණුමට පිටපත් කර ඇත.
C. රු.12 000ක වැටුප් ගිණුම් වල සටහන් කර ඇත්තේ රු.120 000 ලෙසයි.
D. රු.6000 බොල්ණය ණයගැති පාලන ගිණුමට පිටපත් කර නැත.

ඉහත වැරදි නිවැරදි කල පසු සංශෝධිත වර්ෂයේ ලාභය කොපමණද?...........................................................

37) භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයක පහත තොරතුරු දැකිය හැකි විය.

| | |
|---|---|
| -අමු ද්‍රව්‍ය මිලට ගැනුම් | රු. 500 000 |
| -ඍජු ශ්‍රම පිරිවැය | රු. 300 000 |
| -විකුණුම් හා බෙදාහැරීම් පිරිවැය | රු. 75 000 |
| -මුළු නිෂ්පාදන පිරිවැය | රු.1025 000 |
| -අමු ද්‍රව්‍ය තොග වැඩි වීම | රු. 50 000 |



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

-නොනිමි තොග අඩු වීම රු. 25 000

(අ) ප්‍රාථමික පිරිවැය කොපමණද?..................................................................................

(ආ) නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය කොපමණද?............................................................

38) සී/ස සමාගමක සේවකයන්ට කල ගෙවීම් පිළිබඳව පහත තොරතුරු සැපයේ.

| | |
|---|---|
| සේවකයන්ට ගෙවූ වැටුප | රු. 600 000 |
| දළ වැටුපෙන් මුළු අඩු කිරීම | රු. 180 000 |
| අතිකාල දීමනා | රු. 80 000 |

සමාගම සේවක අර්ථසාධක අරමුදල(EPF) සඳහා 15% හා සේවක භාරකාර අරමුදල(ETF) සඳහා 3% දායක වන අතර ඒවා මූලික වැටුප මත ගණනය කරයි.

(අ) සේවකයන්ගේ මූලික වැටුප කොපමණද?............................................................

(ආ) සේවකයින් වෙනුවෙන් දැරූ මුළු වියදම කොපමණද?............................................................

39) 2014.04.01 දින රු.800 000 මිලට ගත් මෝටර්රථයක ඵලදායී ජීව කාලය වර්ෂ 8ක් වන අතර සුන්බුන් වටිනාකම රු.80 000 ලෙස ඇස්තමේන්තු කර ඇත. 2019.03.31 දින මෙම මෝටර්රථයේ ඵලදායී ජීව කාලය වර්ෂ 2න් ඉහළ යන බව නැවත ඇස්තමේන්තු කරන ලදී.

(අ) i 2020.03.31 දිනෙන් අවසන් වර්ෂයේ මෝටර් රථ ක්ෂය ප්‍රමාණය කොපමණද? .........................................

ii 2020.03.31 දිනට සමුච්චිත මෝටර්රථ ක්ෂය ප්‍රමාණය කොපමණද? ...................................................

(ආ) 2020.03.31 දිනට මෝටර් රථයේ ධාරන අගය කොපමණද? ...............................................................

40) නන්දනී, වින්දනී විසින් පවත්වාගෙන යන හවුල් ව්‍යාපාරයේ 2020.03.31 දිනෙන් අවසන් වර්ෂයේ ලාභාලාභ විසර්ජන ගිණුමේ පහත තොරතුරු දැකිය හැකි විය.

| | නන්දනී(රු.000) | වින්දනී(රු.000) |
|---|---|---|
| ප්‍රාග්ධන පොලී | 60 | 40 |
| හවුල් වේතන | 120 | - |
| ලාභ කොටස් | 40 | 20 |

- හවුල්කරුවන්ට ප්‍රාග්ධනය මත 10% පොලී ගෙවයි.

- 2019.04.01 දිනට ජංගම ගිණුම් ශේෂ

නන්දනී රු.80 000

වින්දනී රු.50 000

හවුල්කරුවන් ගැනිලි සිදුකර නැත.

(අ) 2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ශුද්ධ ලාභය හෝ අලාභය කොපමණද? ...............................................

(ආ) 2020.03.31 දිනට හවුල් ව්‍යාපාරයේ මුළු හිමිකම .....................................

41) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 01 (LKAS 01) අනුව සී/ස සමාගමක් සකස් කරන මූල්‍ය ප්‍රකාශන වර්ග දෙක වන්නේ,

i. ........................................................

ii. ........................................................

42) 2019.04.01 දින සමාගමක් විසින් කල්බදු පදනමට මිලට ගත් යන්ත්‍රයක් පිළිබඳව පහත තොරතුරු සැපයේ.



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources
iexamhub

| | |
|---|---|
| මූලික ගෙවීම | රු.200 000 |
| කල්බදු ගෙවීම් වල වර්ථමාන අගය | රු.600 000 |
| ඵලදායී ජීව කාලය වර්ෂ | 5 |
| ගම්‍ය පොලී අනුපාතිකය | 10% |
| වාර්ෂික කල්බදු වාරිකය | රු.200 000 |

(අ) 2020.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ **ජංගම නොවන වගකීම්** යටතේ දැක්විය යුතු කල්බදු ණයහිමි වටිනාකම කොපමණද?..........................................................

(ආ) 2020.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ **ජංගම වගකීම්** යටතේ දැක්විය යුතු කල්බදු ණයහිමි වටිනාකම කොපමණද?..........................................................

43) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 15 (SLFR 15) ප්‍රමිතියට අනුව පොරොන්දු වූ භාණ්ඩ හා සේවා සැපයීම වෙනුවෙන් ගනුදෙනු කරුගෙන් ලබාගැනීමට අපේක්ෂිත ප්‍රතිෂ්ඨාව................................................. වේ.

44) 2019.04.01 දිනට සී/ස රංගනී සමාගමේ සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය කොටස් 60 000ක් හා රු. 3000 000 විය.

I. 2019.04.01 දින එදිනට පැවති සෑම කොටස් 5ට එක බැගින් රු.20 බැගින් වූ රඳවාගත් ඉපැයුම් ප්‍රාග්ධනිත කරන ලදී.
II. 2019.10.01 දින එදිනට පැවති සෑම කොටස් 8ට එක බැගින් රු.50 බැගින් වූ හිමිකම් කොටස් නිකුතුවක් කරන ලදී.

(අ) ) 2020.03.31 දිනට සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය?......................................................

(ආ) සංචිත ප්‍රාග්ධනිත කිරීමට අදාල ද්විත්ව සටහන වටිනාකම සහිතව,

.......................................................................

.......................................................................

45) 2018.04.01 දින රු. 1600 000 මිලට ගත් මෝටර්රථයක් 2019.03.31 දින රු.1800 000කට ප්‍රත්‍යාගණනය කල අතර එම මෝටර්රථය 2020.03.31 දින නැවත රු. 1500 000ට ප්‍රත්‍යාගණනය කරන ලදි.

(අ) 2019.03.31 දින ප්‍රත්‍යාගණනය ගිණුම්ගත කිරීමේ ජනල් සටහන

.....................................................

.....................................................

(ආ) 2020.03.31 දින ප්‍රත්‍යාගණනය ගිණුම්ගත කිරීමේ ජනල් සටහන

....................................................

.....................................................

45) මුදල් ගිණුම හා මුදල් ප්‍රවාහ ප්‍රකාශන සම්බන්ධයෙන් පහත ලක්ෂණ ලියා දක්වන්න.

| | | මුදල් ගිණුම | මුදල් ප්‍රවාහ පුකාශනය |
|---|---|---|---|
| i. | පිළියෙල කිරීමේ අරමුණු | ..................................... | ...................................... |
| ii. | භාවිතා කරන පාර්ශවය | ................................... | ..................................... |

47) පහත දැක්වෙන ගනුදෙනු වලින් සිදුවන මුදල් ප්‍රවාහයන් වර්ගකර දක්වන්න. (තිත් ඉර මත √ ලකුණ යොදන්න)

| ගනුදෙනුව | මෙහෙයුම් | ආයෝජන | මූල්‍ය |
|---|---|---|---|



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

| | | | | |
|---|---|---|---|---|
| i. | රු.65 000 භාණ්ඩ මිලට ගැනුම් | .............. | .............. | ............ |
| ii. | රු. 50 000 ලාභාංශ ගෙවීම | .............. | .............. | ............ |
| iii. | රු.15 000 ස්ථාවර තැන්පත් පොලී ලැබීම | .............. | .............. | ............. |
| iv. | රු.29 000 ලාභාංශ ලැබීම | .............. | .............. | ............. |

48) ව්‍යාපාරයක පහත තොරතුරු ඔබට සැපයේ.

| | |
|---|---|
| අවම තොග මට්ටම | ඒකක 20 000 |
| යළි ඇනවුම් ප්‍රමාණය | ඒකක 30 000 |
| සාමාන්‍ය තොග මට්ටම | ඒකක 35 000 |
| අවම පොරොත්තු කාලය | දින 5 |
| අවම පරිභෝජනය | ඒකක 2 000 |

යළි ඇනවුම් මට්ටම ගණනය කරන්න. ................................................

49) සමාගමක් තනි භාණ්ඩයක් නිපදවනු ලබන අතර එම ඒකකයක් රු.55 කට විකුණනු ලබයි.සමාගම ඒකක 8000 ක් විකුණන්නේ නම් ඒකකයක අලාභය රු.5කි. ඒකක 20 000 විකුණන්නේ නම් ඒකකයක ලාභය රු.7කි.

(අ) මුළු ස්ථාවර පිරිවැය රු. .......................................................

(ආ) ඒකකයක දායකය රු. .......................................................

50) සමාගමක් රු. 3 000 000 නව පරිගණක පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා ව්‍යාපෘතියක් සලකා බලන අතර ඒ පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

ඵලදායී ජීව කාලය වර්ෂ 5කි.

වාර්ෂික ශුද්ධ මුදල් ප්‍රවාහය රු. 500 000කි.

පිළිගෙවුම් කාලය සොයන්න .......................................................



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved



# පෙරහුරු පරීක්ෂණය-13 ශ්‍රේණිය- 2021
# Model Paper- Grade 13-2021

## ගිණුම්කරණය II

කාලය පැය තුනයි විනාඩි 10 යි

**උපදෙස්**

- පළමුවන හා දෙවන ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න පහක ට පමණක් පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු ලිවීම අලුත් කඩදාසියකින් ආරම්භ කරන්න.
- අදාල පෙරවැඩ, පිළිතුරු පත්‍රය සමඟ අමුණන්න.

1) ඉලෙක්ට්‍රික් උපකරණ විකිණීම සිදුකරන සීමිත සුනෙත් පොදු සමාගමේ 2021.03.31 දිනට සාරාංශගත ශේෂ පිරික්සුම පහත දී ඇත.

| විස්තරය | හර(රු.000) | බැර(රු.000) |
|---|---|---|
| දේපළ පිරියත හා උපකරණ | 69,000 | |
| 2020.04.01 දිනට දේපළ පිරියත හා උප.සමුච්චිත ක්ෂය | | 11,000 |
| විකුණුම් | | 89,000 |
| විකුණුම් පිරිවැය | 46,000 | |
| තොගය | 4,250 | |
| 2020.04.01 දිනට වගකීම් සහතික ප්‍රතිපාදන | | 580 |
| වෙළඳ ලැබිය යුතු දෑ | 18,000 | |
| වෙළඳ ගෙවිය යුතු දෑ | | 9,900 |
| බෙදාහැරීමේ පිරිවැය | 6,400 | |
| පරිපාලන වියදම් | 4,830 | |
| මූල්‍ය වියදම් | 1,450 | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය- සාමාන්‍ය කොටස් | | 45,000 |
| ප්‍රත්‍යාගණන සංචිත(ගොඩනැගිලි) | | 2,000 |
| 2020.04.01 දිනට රඳවාගත් ඉපැයුම් | | 3,670 |
| ගෙවූ ආදායම් බදු | 1,900 | |
| 2020.04.01 දිනට ආදායම් බදු සඳහා ප්‍රතිපාදන | | 850 |
| මුදල් හා මුදල් සමාන දෑ | 7,770 | |
| වෙනත් වියදම් | 2,400 | |
| | 162,000 | 162,000 |

අතිරේක තොරතුරු,

2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර පහත දෑ සඳහා ගැලපීම් කළ යුතු වේ.

i. 2021.03.31 දිනට පැවති තොගයෙහි, රු.250 000ක් පිරිවැය වූ තොගයක් කල් ඉකුත් වීමට ආසන්නවම පැවති හෙයින් 2021.04.10 දින රු.20 000ක ප්‍රචාරණ වියදමක් දරා රු.240 000කට විකුණා ඇති අතර



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

එදිනට ඉතිරි තොගයෙහි ශුද්ධ උපලබ්ධි අගය රු.3 980 000ක් විය.2021.05.30 දින අධ්‍යාපන මණ්ඩලය විසින් සමාගමේ මුද්‍රා මුද්‍රා ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇත.

ii. සමාගම වසරක වගකීම් සහතික කාලයක් සහිතව භාණ්ඩ විකුණනු ලබන අතර,පසුගිය වර්ෂය තුළදී සිදුකරන ලද විකුණුම් වෙනුවෙන් රු.600 000ක වගකීම් සහතික වියදම් ප්‍රවර්තන වර්ෂය තුළ ගෙවා බෙදාහැරීමේ පිරිවැයට ඇතුළත් කර ඇත.2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වගකීම් සහතික ප්‍රතිපාදන රු.680 000ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණි.

iii. සමාගම විසින් ඉලෙක්ට්‍රික් උපකරණ විකිණීමට අමතරව CCTV කැමරා විකිණීම විකිණීමෙන් පසු සවිකරදීමටත්, පළමු වසර තුළ නඩත්තු සේවා සැපයීමටත් 2021.02.01 දින ගනුදෙනුකරුවෙකු සමග නව ගිවිසුමකට එළඹෙන ලදී.ගිවිසුමේ මුළු ප්‍රතිෂ්ඨාව පහත පරිදි සමන්විත වේ.

| | |
|---|---|
| CCTV විකුණුම් වටිනාකම | රු.1500000 |
| සවිකිරීමේ ගාස්තුව | රු. 100000 |
| නඩත්තු සේවා සැපයීම | රු. 400000 |

සමාගම විසින් ගිවිසුම මත එකග වූ යන්ත්‍රය 2021.03.10 දින විකුණා ඇති අතර, ඒ සඳහා වූ මුළු ප්‍රතිෂ්ඨාව එකවර මුදලින් ලබා එය විකුණුම් ගිණුමට බැර කර ඇත,2021.03.31 දින යන්ත්‍රය සවිකර අවසන් කරන ලදී.

iv. පහත සඳහන් තොරතුරු දේපළ පිරියත හා උපකරණ හා බැඳේ. (සියලු වටිනාකම් රු.000 වලිනි)

| | 2021.03.31 දිනට පිරිවැය/අගය | 2020.04.01 දිනට සමුච්චිත ක්ෂය |
|---|---|---|
| ඉඩම් | 25000 | - |
| ගොඩනැගිලි | 20000 | 5000 |
| කාර්යාල උපකරණ | 8000 | 2000 |
| මෝටර් රථ | 16000 | 4000 |
| එකතුව | 69000 | 11000 |

කාර්යාල උපකරණ පිරිවැය මත වාර්ෂිකව 5% බැගින්ද.සියලුම මෝටර් රථ පිරිවැයට 25% බැගින්ද වාර්ෂිකව ක්ෂය කළ යුතුය.

v. 2021.01.01 දින රු.800000 ක කාර්යාල උපකරණ මිලදී ගෙන ඇති අතර එය නිවැරදිව ගිණුම්ගත කර ඇත.

vi. 2018.04.01 දින රු.1000000කට මිලදී ගත් මෝටර් රථයක් 2021.03.31 දින රු.350000ක ලාභයක් තබා ගෙන විකුණා ලද මුදල විකුණුම් ගිණුමට බැර කිරීම හැර වෙනත් කිසිම සටහනක් තබා නොතිබුණි.

vii. 2020.04.01 දින ගොඩනැගිලි රු.12 000 000කට දෙවන වරට ප්‍රත්‍යාගණනය කරන ලදී.මීට වසර දෙකකට පෙර ප්‍රථම වරට ප්‍රත්‍යාගණනය කිරීමෙන් ඇති වූ අතිරික්තය ප්‍රත්‍යාගණන සංචිතයෙන් නිරූපනය වේ. ප්‍රත්‍යාගණනයෙන් පසු ගොඩනැගිලි වල ඉතිරි ඵලදායී ජීව කාලය වසර 10 ක් ලෙසත්,සුන්බුන් අගය ශුන්‍ය බවත් උපකල්පනය කරන්න.දෙවන වර ප්‍රත්‍යාගණනයට අදාලව ගිණුම්ගත කර නොමැත.

viii. සමාගමේ මුද්‍රා ප්‍රකාශන විගනනය වෙනුවෙන් වූ රු.250000ක විගනන ගාස්තු වලින් රු.200000ක් සමාගමේ අධ්‍යක්ෂවරයෙකු පෞද්ගලිකව ගෙවා ඇති අතර ඉතිරිය ගෙවිය යුතුව ඇත. අධ්‍යක්ෂවරයා දැරූ විගනන ගාස්තුව ප්‍රතිපූර්ණය කල යුතුව ඇත.මේ සම්බන්ධ කිසිදු ගිණුම්ගත කිරීමක් කර නොමැත.

ix. 2021.03.31 දින සමාගම කල්බදු ගිවිසුමකට එළඹුණු අතර වසර 10 ක කාලයක් සඳහා මෝටර් රථයක භාවිත අයිතිය ලබා ගන්නා ලදී. මෝටර් රථයේ භාවිත අයිතිය ලබා ගැනීමේදී රු.700000ක මූලික ගෙවීමක් කර එය මුද්‍රා වියදම් තුල ගිණුම්ගත කර ඇත. මූලික මිනුම් කිරීමේදී කල්බදු වගකීම



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

රු.8300000ක් විය.2022.03.31 දින පළමු වාර්ෂික කල්බදු වාරිකයරු.4000000ක් විය.වාර්ෂික කල්බදු පොලී අනුපාතිකය 10%කි.

x. වර්ෂය තුළ ගෙවූ ආදායම් බදු තුළ පසුගිය වර්ෂය සඳහා ගෙවූ රු.900000ක් ඇතුලත් වේ. 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුළු බදු වගකීම රු.3500000 ලෙස ඇස්තමේන්තු කර ඇත.

අවශ්‍ය වන්නේ,

LKAS 1(මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම) ප්‍රමිතයට අනුව ප්‍රසිද්ධ කිරීම සඳහා සීමිත සුනෙත් පොදු සමාගමේ පහත මූල්‍ය ප්‍රකාශන (සටහන්ද ඇතුළුව)

1. 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය.
2. 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය.
3. 2021.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය.

( මුළුලකුණු 40 යි.)

2) (අ) සම් භාණ්ඩ නිෂ්පාදන සමාගමක් 2021 මාර්තු මාසයට අදාල තොරතුරු පහත පරිදි වේ.

| | | | |
|---|---|---|---|
| දිනක අමු ද්‍රව්‍ය පරිභෝජනය | ඒකක | -උපරිම | 250 |
| | | -සාමාන්‍ය | 200 |
| පොරොත්තු කාලය | දින | -උපරිම | 4 |
| | | - සාමාන්‍ය | 3 |

මාර්තු මාසය තුලදී අමු ද්‍රව්‍ය මිලදී ගැනිම හා නිෂ්පාදනාගාරයට නිකුත් කිරීම් පහත වේ.

| දිනය | විස්තරය | ඒකක මිල(රු.) | ප්‍රමාණය ඒකක |
|---|---|---|---|
| 03.01 | ශේෂය | 20 | 400 |
| 03.05 | මිලදී ගැනීම් | 25 | 1000 |
| 03.12 | නිකුත් කිරීම් | | 1000 |
| 03.20 | මිලදී ගැනීම් | 28 | 1000 |
| 03.26 | නිකුත් කිරීම් | | 600 |
| 03.30 | මිලදී ගැනීම් | 26 | 1000 |

අමු ද්‍රව්‍ය තොග නිකුත් කිරීම මිල කිරීම සඳහා ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීමේ ක්‍රමය (FIFO) භාවිතා කරයි.
මාර්තු මාසයේ සේවකයින්ගේ වැටුප් සම්බන්ධ තොරතුරු පහත වේ.

-සේවකයින්ගේ මූලික වැටුප රු.600000කි. මෙයින් 2/3ක් නිෂ්පාදන සේවක වැටුප් වන අතර 1/3ක් පරිපාලන සේවක වේතන වේ.

- සේවක දිරි දීමනා නිෂ්පාදන සේවකයන් සඳහා රු. 40000
- අතිකාල දීමනා - නිෂ්පාදන සේවකයන් සඳහා රු.30000
  - පරිපාලන සේවකයන් සඳහා රු.20000
- සේවකයින්ගේ ණය වාරික අඩු කිරීම් රු.40000
- සේවක අර්ථසාධක අරමුදලට (EPF) සඳහා සේව්‍ය හා සේවක දායකයන් පිළිවෙලින් 12%ක් හා 8%කි.

සේවා නියුක්ති භාර අරමුදලට(ETF) සේව්‍ය දායකය 3%කි. EPF හා ETF දායකයන් මූලික වැටුප මත ගණනය කරන අතර දායකය ගෙවීම් ඊලග මාසයේදී ගෙවීම් කරයි.

අවශ්‍ය වන්නේ,
1.

I. යළි ඇනවුම් මට්ටම
II. උපරිම තොග මට්ටම



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

III. අවම තොග මට්ටම
IV. මාසයේ පර්භෝජනය කල ද්‍රව්‍ය පිරිවැය.
V. 2021.03.31 දිනට අමු ද්‍රව්‍ය තොගයේ වටිනාකම.

2.

i. නිෂ්පාදන සේවකයින්ගේ මුළු වැටුප් වියදම
ii. වැටුප් පාලන ගිණුම
iii. EPF වගකීම හා ETF වගකීම

(ලකුණු 20 යි.)

(ආ) පාරමී නිෂ්පාදන සමාගම තම නිෂ්පාදනයට අදාලව එකලස් හා නිමවුම් ලෙස නිෂ්පාදන අංශ 2ක් හා සේවා අංශයක් පත්වා ගනී. අදාල පිරිවැය මධ්‍යස්ථානයන්හි ඇස්තමේන්තුගත පොදුකාර්ය පිරිවැය පහත දැක්වේ.ඉදිරි මූල්‍ය වර්ෂය සඳහා ඒකක 4000ක ක්‍රියාකාරී මට්ටමේදී පොදුකාර්ය පිරිවැය පහත වේ.

| විස්තරය | රු.000' |
|---|---|
| විදුලිය( ආලෝකය) | 160 |
| කම්හල් කුලී | 100 |
| යන්ත්‍ර රක්ෂණය | 60 |
| සේවක රක්ෂණය | 40 |
| යන්ත්‍ර ක්ෂය | 120 |
| සේවක සුබසාධනය | 80 |

පහත අමතර තොරතුරුද සපයා ඇත.

i. පොදු කාර්ය පිරිවැය විභජන පදනම් පහත පරිදි වේ.

| පිරිවැය මධ්‍යස්ථාන | යන්ත්‍ර පිරිවැය රු. | බිම් ප්‍රමාණය වර්ග මීටර් | සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| එකලස් | 600000 | 1200 | 40 |
| නිමැවුම් | 400000 | 600 | 40 |
| සේවා අංශය | 200000 | 200 | 20 |

ii. නිෂ්පාදන කළමනාකරුවන්,දෙදෙනෙකු එකලස් අංශයේද, එක් අයකු නිමැවුම් අංශයේද සේවයේ යොදා ඇත. ඔවුන් එක් අයෙකුට රු.40000ක මාසික වේතනයක් ගෙවනු ලැබේ.

iii. එකලස්,නිමවුම් හා සේවා අංශය සඳහා වෙනත් නිශ්පාදන පොදු කාර්ය පිරිවැය පිළිවෙලින් රු.470000ක්, රු.250000ක් හා රු.160000න් වේ.

iv. සේවා අංශයේ වාර්ථා අනුව නිශ්පාදන අංශය සඳහා සපයන ලද සේවා පැය ගණන් පහත පරිදි විය.
එකලස් අංශය පැය 80
නිමවුම් අංශය පැය 40
සේවා අංශයේ පොදු කාර්ය පිරිවැය නිශ්පාදන දෙපාර්තුමේන්තු දෙක අතර සපයන ලද සේවා පැය අනුව නැවත විභාජනය කරයි.

v. භාණ්ඩ ඒකකයක් නිශ්පාදනය කිරීම සඳහා සත්‍ය යන්ත්‍ර පැය එකලස් අංශයට පැය 3ක්ද, නිමවුම් අංශයට පැය 4ක්ද ගතවේ.

vi. ඒකකයක් සඳහා ප්‍රාථමික පිරිවැය රු.780ක් වැය වේ.

vii. සමාගම විකුණුම් මිල මත 25%ක ලාභ ආන්තිකයක් ලැබෙන පරිදි විකුණුම් මිල තීරණය කරයි.

අවශ්‍ය වන්නේ,

1. විභජන පදනම පැහැදිලිව දක්වමින් පොදු කාර්ය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව.
2. එකලස් හා නිමවුම් දෙපාර්තුමේන්තු සඳහා පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

3. නිෂ්පාදන භාණ්ඩයේ විකුණුම් මිල.

(ලකුණු 20 යි.)

(මුළු ලකුණු 40 යි.)

3) 2021.මාර්තු මාසය තුළ 'නාමල් ට්‍රේඩ් සෙන්ටර්' ව්‍යාපාරයේ සිදු වූ ගනුදෙනු වල බලපෑම පහත ගිණුම්කරණ සමීකරණ තුලින් නිරූපණය වේ.
මාර්තු මාසය තුළ දී ව්‍යාපාරයෙන් අයිතිකරු මුදල් හෝ භාණ්ඩ ගැනිලි සිදුකර නොමැති බව සලකන්න.

රු.'000'වලින්

| ගනුදෙනු අංකය | දේපළ පිරියත හා උපකරණ | තොගය | වෙළඳ ලැබිය යුතු දෑ | ඉදිරියට ගෙවූ වියදම් | මුදල් | බැංකු ණය | වෙළඳ ගෙවිය යුතු දෑ | උපචිත වියදම් | ලද අත්තිකාරම් | හිමිකම |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2021.03.01 ශේෂය | 4900 | 600 | 820 | 80 | 610 | 200 | 100 | 30 | 40 | 6640 |
| i. | +500 | | | | | +500 | | | | |
| ii. | | +200 | | | -100 | | +100 | | | |
| iii. | | -60 | +120 | | | | | | | +60 |
| iv. | | +10 | -20 | | | | | | | -10 |
| v. | | | | -30 | -50 | | | | | -80 |
| vi. | | | -400 | | +380 | | | | | -20 |
| vii. | | -80 | | | +120 | | | | | +40 |
| viii. | | | | | | | | | | -25 |
| | | | | | | | | | | +25 |
| ix. | | -100 | | | +100 | | | | -40 | +40 |
| x. | | | | | -30 | | | -30 | | |
| | | | | | | | | +25 | | -25 |
| xi. | | -8 | | | | | | | | -8 |
| xii. | | | | | -100 | | -95 | | | +5 |
| xiii. | | | | -50 | | | | | | -50 |
| xiv. | -250 | | | | +240 | | | | | -10 |
| xv. | | | | | -28 | -22 | | | | -6 |
| | | | | | | | | | | |

අතිරේක තොරතුරු,

2021.මාර්තු මාසය සඳහා බැංකුවෙන් ලැබී ඇති බැංකු ප්‍රකාශය හා සැසඳීමේ දී පහත සඳහන් දෑ ව්‍යාපාරයේ ගිණුම්ගත වී නොතිබුණි.

බැංකුව අය කළ බැංකු ගාස්තු රු.2000

ණයගැති සෘජු ප්‍රේෂණ රු.35000

ස්ථාවර නියෝග මත ගෙවා ඇති අයිතිකරුගේ ජීවිත රක්ෂණ වාරිකය රු.5,000.

අවශ්‍ය වන්නේ,

1. ඉහත අංක (i) සිට (xv) දක්වා ගනුදෙනු වටිනාකම් සහිතව විස්තර කිරීම.
2. 2021.03.31 දිනෙන් අවසන් මාසය සඳහා ශුද්ධ වත්කම් ඇසුරින් ලාභය ගණනය කිරීම.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

3.2021.03.31 දිනට නිවැරදි මුදල් ශේෂය.

(මුළු ලකුණු 40 යි.)

4) (අ) 'හිරු' සුභ සාධක සංගමයේ සාමාජික සංඛ්‍යාව 60ක් වන අතර, එක් අයකුගේ වාර්ෂික සාමාජික ගාස්තුව රු.1200කි. සංගමයේ පොත් වලින් උපුටා ගත් තොරතුරු පහත වේ.

I. 2021.04.01 දිනට පැවති වත්කම් හා වගකීම්,

| | |
|---|---|
| කාර්යාල උපකරණ ධාරණ අගය | රු. 250 000 |
| හිග සාමාජික මුදල් | රු. 8 400 |
| මුදල් | රු. 60 000 |
| ඉතිරි ලිපි ද්‍රව්‍ය | රු. 6 000 |
| ඉදිරියට ලද සාමාජික මුදල් | රු. 2 400 |
| උපචිත විදුලිය | රු. 800 |

II. වර්ෂය තුල මුදල් ලැබීම් හා ගෙවීම්,

**ලැබීම්,**

| | |
|---|---|
| සාමාජික මුදල් - 2019/20 වර්ෂය සඳහා | රු. 6 000 |
| - 2020/21 වර්ෂය සඳහා | රු. 62 400 |
| - 2021/22 වර්ෂය සඳහා | රු. 3 600 |
| පරිත්‍යාග | රු. 20 000 |
| කාර්යාල උපකරණ විකුණුම් | රු. 40 000 |

**ගෙවීම්,**

| | |
|---|---|
| කාර්යාල උපකරණ මිලට ගැනුම් | රු.100 000 |
| විදුලි බිල් ගෙවීම | රු. 8 000 |
| ලිපි ද්‍රව්‍ය ගැනුම් | රු. 4 000 |

III. 2020.04.01 දිනට සාමාජික මුදල් හිගව පැවති සාමාජිකයින් දෙදෙනෙකු ප්‍රවර්තන වර්ෂයේද නොගෙවීම හෙයින් ඔවුන්ගේ සාමාජිකත්වය අහෝසි කිරීමට සංගමය තීරණය කරන ලදී.

IV. වර්ෂය තුලදී ධාරණ අගය රු.50000ක් වූ කාර්යාල උපකරණයක් විකුණා ඇත.

2021.03.31 දිනට පැවති කාර්යාල උපකරණවල ධාරණ අගය රු.285000කි.

2021.03.31 දිනට රු.2400ක් වටිනා ලිපි ද්‍රව්‍ය ඉතිරිව පැවති අතර, එදිනට උපචිත විදුලිය රු.1200කි.

අවශ්‍ය වන්නේ,

1. සාමාජික මුදල් ගිණුම.
2. 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා 'හිරු' සුභ සාධක සංගමයේ ආදායම් ප්‍රකාශනය.

(ලකුණු 10 යි.)

(ආ) එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි ගත සීමිත ඇතුගල්පුර සමාගම භාණ්ඩ මිලදී ගැනිම මුදලට පමණක් සිදුකරන අතර, භාණ්ඩ විකිණීම මුදලට මෙන්ම ණයට සිදු කරනු ලබයි.

2021.03.31 දිනෙන් අවසන් මාසයට පහත තොරතුරු අදාල වේ.



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

I. 2021.03.31 දිනට ණයගැති ලෙජරයෙන් උපුටා ගත් තොරතුරු (රු.000')

| විස්තරය | නාගප්පා ට්‍රේඩර්ස්(රු.000') | සාලිය ව්‍යාපාරය(රු.000') | ජනහිත ට්‍රේඩර්ස්(රු.000') | එකතුව |
|---|---|---|---|---|
| 2021.03.01 ශේෂය | 250 | 100 | 75 | 425 |
| විකුණුම්(8% VATසහිතව) | 324 | 270 | 108 | 702 |
| ආපසු එවුම්(8% VATසහිතව) | (54) | (27) | - | (81) |
| මුදල් ලැබීම් | (190) | (120) | (73) | (383) |
| දුන් වට්ටම් | (10) | (5) | (2) | (17) |
| 2021.03.31 ශේෂය | 320 | 218 | 108 | 646 |

II. 2021.03.31 දිනට මුදල් ගිණුමේ ශේෂය රු.280 000ක් විය. ණයගැති ලෙජරයේ ඇතුළත් මුදල් ගනුදෙනු වලට අමතව පහත ගනුදෙනු මාර්තු මාසය තුළ සිදු වී තිබුණි..

මුදල් ලැබීම්,

| | |
|---|---|
| අත්පිට විකුණුම්(8% VATසහිතව) | රු.432000 |
| කොමිස් ආදායම් | රු. 20000 |
| බැංකු ණය ලබා ගැනීම. | රු.500000 |

මුදල් ගෙවීම්,

| | |
|---|---|
| අත්පිට ගැනුම්(8% VATසහිතව) | රු.1296000 |
| සේවක වැටුප් ගෙවීම(සේවක අර්ථසාධක සඳහා, 8%ක සේවාදායකය අඩු කර ගෙවූ) | රු. 184000 |
| 2021.03.31 දිනට පැවති ගෙවිය යුතු EPF වගකීම පියවීම | රු. 40000 |
| ගෙවූ VAT | රු. 25000 |
| ගෙවූ බැංකු ණය වාරිකය(රු.6000ක පොළී සමග) | රු. 18000 |

III. 2021.03.01 දිනට ණයගැති ලෙජර් ශේෂ ලැයිස්තුවේ එකතුව එදිනට ණයගැති පාලන ගිණුමේ ශේෂයට සමාන විය. කෙසේ නමුත් 2021.03.31 දිනට පිළියෙල කරන ලද ණයගැති පාලන ගිණුමේ ශේෂය ශේෂ ලැයිස්තුවේ එකතුවට අසමාන වී ඇත. වෙනසට හේතු සෙවීමේදී පහත සඳහන් කරුණු අනාවරණය විය.

අ) මුදල් ලැබීම් ජ'නලයේ ණයගැති විශ්ලේෂණ තීරුවේ එකතුව වූ රු.383000, ණයගැති පාලන ගිණුමේ සටහන් වී ඇත්තේ රු.385000ක් ලෙසය.

ආ) ආපසු එවුම් පාලන ගිණුමේ සටහන් වී ඇත්තේ VAT රහිත වටිනාකම පමණි.

ඉ) ජනහිත ට්‍රේඩර්ස් ලබා දුන් රු.73000ක චෙක්පත අගරු වී ඇති බව බැංකුව දැනුම් දීමක් කර තිබුණද එය ව්‍යාපාරයේ පොත් වල වාර්තා වී නොතිබුණි.

අවශ්‍ය වන්නේ,



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

1. 2021.03.31 දිනෙන් අවසන් මාසය සඳහා පහත මූලික සටහන් පොත්,
   i. විකුණුම් ජ' නලය හා ආපසු එවුම් ජ' නලය.
   ii. මුදල් ලැබීම් හා ගෙවීම් ජ' නලය.
2. 2021.03.31 දිනෙන් අවසන් මාසය සඳහා පහත සඳහන් ගිණුම්,
   i. ණයගැති පාලන ගිණුම (වැරදි නිවැරදි කිරීමට පෙර)
   ii. මුදල් ගිණුම.
   iii. සංශෝධනය කරන ලද ණයගැති පාලන ගිණුම.
   iv. එකතු කළ අගය මත බදු (VAT) ගිණුම.
   v. ගෙවිය යුතු EPF ගිණුම.

(ලකුණු 30 යි.)

(මුළුලකුණු 40යි)

5) (අ) අසිත, පැතුම් හා සිතුම් පහත කොන්දේසි යටතේ හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යයි.
- ❖ අසිත, පැතුම් හා සිතුම් පිළිවෙලින් 2:2:1 අනුපාතයට ලාභාලාභ බෙදා ගනී.
- ❖ සෑම හවුල්කරුවෙකුටම මසකට රු. 40000 බැගින් වේතනයකට හිමිකම් කියයි.
- ❖ සෑම හවුල්කරුවෙකුටම වර්ෂයේ ආරම්භක ප්‍රාග්ධන ශේෂය මත 10% ක වාර්ෂික පොලියකට හිමිකම් කියයි.
- ❖ ව්‍යාපාරයේ කීර්තිනාමය හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම තුළින් ගලපනු ලබන අතර, හවුල්කරුවන් සමග සිදුකරන අනෙකුත් සියලුම ගනුදෙනු ඔවුන්ගේ ජංගම ගිණුම් මගින් සටහන් කරනු ලබයි.

2021.03.31 දිනට හවුල් ව්‍යාපාරයේ ශේෂ පිරික්සුම පහත පරිදි වේ.

| විස්තරය | හර(රු.000) | බැර(රු.000) |
|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම්, | | |
| අසිත | | 5000 |
| පැතුම් | | 4000 |
| සිතුම් | | 3000 |
| ජංගම ගිණුම්, | | |
| අසිත | 200 | |
| පැතුම් | | 400 |
| සිතුම් | | 200 |
| විකුණුම් | | 8000 |
| වෙළඳ ලැබිය යුතු දෑ | 1500 | |
| විකුණුම් පිරිවැය | 3240 | |
| 2021.03.31 දිනට තොගය | 800 | |
| 2020.04.01 දිනට සිතුම්ගේ ණය ගිණුම | | 400 |
| දේපළ පිරියත හා උපකරණ(2021.03.31 දිනට) ධාරණ අගය | 12000 | |
| මෙහෙයුම් වියදම්(ණය පොලී සහිතව) | 2560 | |
| ණය ආපසු ගෙවීම් - සිතුම් | 210 | |
| ගැනිලි - අසිත | 200 | |
| පැතුම් | 100 | |
| මුදල් | 190 | |
| | 21000 | 21000 |

අතිරේක තොරතුරු,
- i. 2021.03.31 දිනට තොගය භෞතික ආගනනය මත පදනම්ව මිනුම් කර ඇත.
- ii. වර්ෂය තුළ අසිත හා පැතුම් සිදුකල ගැනිලි පිළිවෙලින් රු.30000ක් හා රු.10000ක් විය. මේවා මෙතෙක් පොත් වල ගිණුම්ගත කර නොමැත.
- iii. ශේෂ පිරික්සුම තුළ දක්වා ඇති සිතුම්ගේ ණය ආපසු ගෙවීම් ගිණුමේ ශේෂය, 2020.09.30 දින තෙක් ගෙවූ ණයපොලිය සහ එදිනට ණය මුදලින් 50% ක් පියවීම සඳහා ගෙවූ මුදලින් සමන්විත වේ. ඉතිරි ණයශේෂය සඳහා ගෙවිය යුතු පොලිය ගිණුම්ගත කර නොමැත.



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources
iexamhub

iv. හවුල්කරුවන්ට මාස 6ක් සඳහා වැටුප් ගෙවා ඇති අතර, එය ව්‍යාපාරයේ සේවක වැටුප් ගිණුමට හර කර ඇත.
v. 2020.10.01 දින ව්‍යාපාරයේ දේපළ පිරියත හා උපකරණ රක්ෂණය කල අතර, එදිනම 2021.09.30 දිනෙන් අවසන් වර්ෂය සඳහා රු.500 000 ක් වූ රක්ෂණ වාරිකය සිතුම් විසින් පෞද්ගලික මුදලින් ගෙවා තිබුණද, එය ගිණුම්ගත කිරීමක් හෝ ප්‍රතිපූර්ණය කිරීමක් කර නොමැත.
vi. 2021.03.31 දින අසිත හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගන්නා ලදී. එදිනට ව්‍යාපාරයේ කීර්තිනාමය රු.600 000 ක් ලෙස ඇස්තමේන්තු කරන ලදී. එදින සිට පැතුම් හා සිතුම් ලාභාලාභ සම සමව බෙදාගැනීමට ගිවිස ගන්නා ලදී. එදින අසිතට ගෙවිය යුතු මුදලින් 50%ක් මුදලින් ගෙවීමටත්, ඉතිරිය ණය ගිණුමකට මාරු කිරීමට එකග වන ලදී.

අවශ්‍ය වන්නේ,

1. 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය.(විසර්ජනද ඇතුළුව)
2. 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන හා ජංගම ගිණුම්.

(ලකුණු 20 යි.)

(ආ) සීමිත තිලකසිරි පොදු සමාගමේ 2020.03.31 දිනට හා 2021.03.31 දිනට සාරාංශගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශන පහත පරිදි වේ.

| | 2021.03.31 දිනට | 2020.03.31 දිනට |
|---|---|---|
| | (රු.000) | (රු.000) |
| දේපළ පිරියත හා උපකරණ ධාරණ අගය | 33200 | 27300 |
| තොගය | 3000 | 2800 |
| වෙළඳ ලැබිය යුතු | 3200 | 3600 |
| මුදල් හා මුදල් සමාන දෑ | 800 | 1000 |
| මුළු වත්කම් | 40200 | 34700 |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය- සාමාන්‍ය කොටස් | 19000 | 16000 |
| ප්‍රත්‍යාගනන සංචිතය (ඉඩම්) | 500 | - |
| පොදු සංචිත | 400 | - |
| රඳවාගත් ඉපැයුම් | 11000 | 8800 |
| බැංකු ණය | 3000 | 2000 |
| වෙළඳ ගෙවිය යුතු | 4500 | 6500 |
| ආදායම් බදු ප්‍රතිපාදන | 300 | 400 |
| බැංකු අයිරාව | 1500 | 1000 |
| මුළු හිමිකම හා වගකීම | 40200 | 40200 |



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

අතිරේක තොරතුරු,

i. වර්ෂය තුලදී පිරිවැය රු.1 200 000 ක් වූ කාර්යාල උපකරණ රු.850 000කට විකුණන ලදී. විකුණන දිනට මෙම උපකරණ වල සමුච්චිත ක්ෂය රු.400000 ක් විය.
ii. වර්ෂය තුලදී සමාගම අතුරු ලාභාංශ ලෙස රු.800000ක් ගෙවූ අතර, රු.500000ක රඳවාගත් ඉපැයුම් ප්‍රාග්ධනිත කර ඇත. තවද සමාගම සාමාන්‍ය කොටස් 20000ක් හිමිකම් නිකුතුවක් සිදුකර ඇත.(කොටසක් රු.125/-බැගින්)
iii. වර්ෂය තුල මිලදී ගත් සියළු දේපළ පිරියත හා උපකරණ අත්පිට මුදලට මිලදී ගෙන ඇත. වර්ෂය තුල ප්‍රථම වතාවට ඉඩම් ප්‍රත්‍යාගනනය කිරීමෙන් ප්‍රත්‍යාගනන අතිරික්තයක් වාර්තා කර ඇත.
iv. ප්‍රවර්තන වර්ෂය සඳහා දේපළ පිරියත හා උපකරණ ක්ෂය හා ආදායම් බදු වියදම පිළිවෙලින් රු. 2 000 000 ක් සහ රු. 850000 ක් විය.

අවශ්‍ය වන්නේ,
LKAS 07 (මුදල් ප්‍රවාහ ප්‍රකාශනය) ප්‍රමිතියට අනුව 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත තිලකසිරි පොදු සමාගමේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය.

(ලකුණු 20 යි.)
(මුළු ලකුණු 40 යි.)

6) (අ) 2020.04.01 දින මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලද සීමිත රවිදු පොදු සමාගමේ පහත තොරතුරු 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාල වේ.

| විස්තරය | රු.000 |
|---|---|
| විකුණුම් | 30000 |
| ආදායම් බදු වියදම | 500 |
| වර්ෂයේ ලාභය | 2500 |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය- සාමාන්‍ය කොටස් | 6500 |
| මුළු වත්කම් | 15000 |
| මුළු වගකීම් | 6000 |

අතිරේක තොරතුරු,

i. සමාගම භාණ්ඩ අලෙවිකරනුයේ පිරිවැයට 50% ක ලාභාන්තිකයක් සහිතවය.
ii. මුළු වත්කම් වලින් 40% ක් ජංගම වත්කම් වේ. ජංගම වත්කම් වලින් 40% ක් අවසන් තොගය සමන්විත වේ.
iii. මුළු වගකීම් වලින් 50% ක් දිගුකාලීන ණය වන අතර ඉතිරිය ජංගම වගකීම් වේ.

දිගුකාලීන ණය 2020.04.01 ලබාගෙන ඇති අතර වාර්ෂික පොලී අනුපාතය 20% කි.
අවශ්‍ය වන්නේ,
2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත අනුපාත ගණනය කිරීම.

i. ජංගම අනුපාතය.
ii. පොලී ආවරණ අනුපාතය.
iii. දළ ලාභ අනුපාතය.
iv. තොග පිරිවැටුම් අනුපාතය.
v. හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය.

(ආ) නිෂ්පාදන සමාගමක් තම නිෂ්පාදන ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා රු.80000 ක වියදමක් දරා ශක්‍යතා අධ්‍යානයක් කර පැරණි යන්ත්‍රය වෙනුවට නව යන්ත්‍රයක් මිලදි ගැනීමට සලකා බලයි. ඒ පිළිබඳ විස්තර පහත වේ.

| | |
|---|---|
| නව යන්ත්‍රයේ පිරිවැය | රු. 1 200 000 |
| නව යන්ත්‍රයේ ඵලදායී ජීව කාලය | වර්ෂ 4 කි. |



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources
iexamhub

නව යන්ත්‍රයේ සුන්බුන් අගය රු.200 000
පැරණි යන්ත්‍රයේ පිරිවැය රු.800 000

අතිරේක තොරතුරු,

i. නව යන්ත්‍රය භාවිතා කිරීමෙන් වාර්ෂිකව බදු පසු ලාභයේ වාර්ෂික වැඩි වීම රු.100 000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.
ii. නව යන්ත්‍රය මිලදී ගැනීමේදී පැරණි යන්ත්‍රය රු.50 000 ක වියදමක් දරා රු.250 000 කට විකුණා ගැනිමට අපේක්ෂිතයි.
iii. නව යන්ත්‍රය භාවිතා කිරීමෙන් රු.200 000 ක අතිරේක කාරක ප්‍රාග්ධනයක් ආරම්භක අවස්ථාවේ යෙදීමට සිදුවන බවත්, එය ජීව කාලය අවසානයේදී ආපසු අයකර ගැනීමට හැකි වේ.

10% අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය මත වට්ටම් සාධක (ආසන්න දශම ස්ථාන දෙකකට) පහත වේ.

| වසර | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|
| වට්ටම් සාධකය | 0.91 | 0.83 | 0.75 | 0.68 |

අවශ්‍ය වන්නේ,

1. ව්‍යාපෘතියේ එක් එක් වර්ෂය සඳහා මුදල් ගලා ඒම හා මුදල් ගලා යෑම් ලේඛනය.
2. ව්‍යාපෘතියේ ශුද්ධ වර්තමාන අගය.
3. ශුද්ධ වර්තමාන අගය මත පදනම්ව නව යන්ත්‍රය මිලදී ගැනීම සඳහා නිර්දේශය.

(ඉ) වයඹ වෙළෙඳ සංගමයට ආධාර පිණිස දින තුනක වේදිකා නාට්‍ය සංදර්ශනයක් පැවැත්වීමට තීරණය කරයි. ඇස්තමේන්තුගත සංගමයේ වියදම් පහත පරිදි වේ.

| | |
|---|---|
| දිනක ශාලා කුලිය | රු.10000 |
| ප්‍රචාරණ වියදම් | රු.25000 |
| දින තුනටම අදාල සංග්‍රහ වියදම් | රු.20000 |
| එක් නාට්‍යයක් සඳහා දිනකට | රු.75000 |

සියළු අනෙකුත් සංවිධාන කටයුතු පෞද්ගලික ආයතනයකට ලබා දී ඇති අතර, වෙළෙඳ සංගමය ප්‍රවේශ පත්‍රයක වටිනාකමින් 20% ක් අදාල පෞද්ගලික ආයතනයට ලබා දෙනු ඇත.

ප්‍රවේශ පත්‍රයක මිල රු. 500 කි.

අවශ්‍ය වන්නේ,

i. ස්ථාවර පිරිවැය.
ii. ඒකකයක දායකය.
iii. මුළු පිරිවැය ආවරණය කිරීමට අලෙවි කළ යුතු ටිකට් පත් සංඛ්‍යාව.
iv. ප්‍රවේශ පත්‍ර 1000 ක් අලෙවි කලේ නම්,
(අ) ආදායම් ප්‍රකාශනය.
(ආ) ලාභ පරිමා සටහන.
v. ප්‍රවේශ පත්‍ර අලෙවි වූයේ 600 ක් නම් මුළු පිරිවැය ආවරණය කර ගැනීමට එක් ටිකට් පතක් අලෙවි කල යුතු මිල.

(ලකුණු 20 යි.)

(මුළු ලකුණු 40 යි.)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources